## අභිමි සෙනෙහස



පුංචි පුංචි මිණි කැට දිලිසෙනවා
හොයා ගන්න බැහැ මට මගෙ පැටියා
දූව දැන් ලොකු ඇති හරියට දග ඇති
මාව හොයන්න ඇති
දූකින් අඬන්න ඇති........

අපි දෙන්නගෙ දූක අපි දෙන්නගෙ ලඟ
සසර ගමන ඇයි මෙච්චර දූක්බර......

පායන තරු මැද ... හිරු මැද ... සඳුමැද
කවි ගී ලිව්වා .... සුළඟේ පා කර
යැවුවා දෝණිට................

උඹ නැති දා සිට .... සතුටු කඳුළු
නැහැ දැක්කේ මගෙ නෙත
උඹටත් එහෙමද ඇහුනද ගී පද.......

නිසලවූ දාකදි මගෙ ගත හෙට දින
හෙලන්නෙපා එක කඳුලක් ඒ මත..
එත් දූවේ සුදූ පෙම්බර දෝණී......
ඇවිත් බලන්නකො තාත්තගෙ
මළකද......

**උදය ගෝවින්න**

## අවසන් ඉල්ලීම

හැරිස් පරකන්දෙණිය
**පෙන්රිත්**

අග්නි ජාලාවක්ය සොඳුර ඔබ
කදෝ පැණි භූමිකා මට හිමියි
බාඳුරා මල් පුඩුව මට ඔබේ
සදා කල් සුව ගෙනෙන සයනයයි

ජීවිතේ මහා වැලි කතර කොන
රැළි නගන කුරිරු මිරිඟුව ඔබයි
සා පිපාසිත මුවෙකු සේ එදෙස
දූවා පා බිඳී මා අසරණයි

ඔබ දිවා කල පිපුණු තරුවකිය
අමාවක රැයේ ඔබ සඳ වතයි
මේ මහා භද්‍ර කල්පය ගෙවෙන
දින අහස් කුස නැගෙන හිරු ඔබයි

මැරි මැරී යලි ඉපිද දෙතුන් වර
මේ රැගුම මට තවත් කැප නැතෙයි
අවසාන හුස්ම පොද ගන්න මට ඉඩ දෙන්න
පිනීවා සම්මුතිය වලංගුයි

## අවසන් පැතුම




තෙත සිඳුනු නුඹෙ හදේ මට ඉඩක් නොදුන්නැයි
නැත මගේ තුන් හිතක නොහාඳ බිඳුවක් ළඳේ
කතර දිවි ගත කරන අසුරු සැන ගෙවී ගොස්
මතකයෙන් සිහින සුව ගිළිහේවි හෙට උදේ

සිත සලිත වූ එදින මතක පොත ගිණි තබා
ගත පෙළන හිර ලෙසින් ඇයි ද නුඹ හිනැහුණේ
ගිණි සිසිල අකැප කල මගෙ අඳුර මට හොඳයි
හද කොනෙන් පිටවෙයන් ඇනෙන කටු විස ගෙනේ

දිවි සයුර කෙළවරේ හිරු බසින මතු දිනේ
පව් නොකළ මගෙ හිතට නැත වරද කිසි කලේ
හැරමිටිය අතට ගත් දිනෙක යළි මුණ ගැසී
සසර මතු හමු නොවන ලෙස ගිවිස ගමු ළඳේ

**රසික සූරියආරච්චි**
pemgee.blogspot.com



පහන් වැට ට ලියන්න. සන්නස
පහන් වැට කාව්‍ය නිර්මාණ
විශේෂාංගයට ලැබෙන කවි අතරින්
එක් කවියකට වටිනා ඩීවීඩී තැටියක්
පිරිනැමීමට ඔස්ට්‍රේලියාව පුරා අව්‍යාජ
ඩීවීඩී තැටි බෙදාහරින DBSJ
එන්ටප්‍රයිස් සූදානම් ය.
**DBJS Enterprise Tel/Fax 03 8336 1113**

**Pahan Weta. Sannasa** PO Box 172 Reservior VIC 3073
Australia email : info@sannasa.net

## දරුවනි මගේ වසන්ති සෙනවිර

මතකයි ඒ ඔබ මෙලොවට ආව දිනේ
මම මව් පදවි ලැබුවෙමි අගරජින වගේ
සිටියත් උස් මහත් වී අද දූවේ පුතේ
ඔබ තවමත් පොඩියි පුංචියි සිතට මගේ

කන්නට ගියත් හොඳ මදි යැයි කරන වදේ
දූන්නත් අඳින්නට අදි මදි කරන රගේ
මේ දඟකාරකම් මැද මා දිවිය ගෙවේ
ඔබ දරුවන්ය මට දෙවියන් දූන් අගේ

හදවත පිරී ඉතිරී යන සෙනේහයෙන්
මම ඔබ තුරුළු කරගමි ලොව ලැබුනු ලෙසින්

ලොව ඇති සියළු සැප කැටි කොට දෝත දරන්
මම විඳගනිමි ඔබ හිනැහෙන විටදි තුටින්

නින්දට ගිය විටදි ඔබ සැම හැම රෑම
දූනෙනා කාංසිය ගත එතෙනා තනිය
ලෙස මට දූනෙයි ඔබ ඉගිලී ගිය දිනෙක
ලොව තතු මේ වෙතත් එය ඉවසමි කෙලෙස

ගේ දොර වතුපිටිද වස්තුව එකතු කල
අන් හැම දේම පහළයි දරුවනි ඔබට
සිටියොත් මල් විලස පිපිලා සුවඳ දෙන
මම ජීවිතය දිනුවෙමි නැහැ සැකක් මට

අසහාය ගායක ගායිකාවන් ගීත ගායනයට මුලින්ම එක් වුණෙත් මේ අවස්ථාවේ දීයි. ඒ වගේම සමාගම් දෙකට වෙන වෙනම ගිවිසුම් අත්සන් කර තිබූ නිසා රුක්මනී දේවිටත්, එඩී ජයමාන්නටත් ග්‍රැමෆෝන් සඳහා එකම යුග ගීතයක්වත් ගායනා කරන්න බැරි වුණා. කාගිල්ස් සමාගමත් මේ ගීත පටිගත කිරීමට දායක වුණු අතර 70 දශකය වෙනතුරුම වෘත්තීය මට්ටමක් ජනප්‍රියත්වයත් රැකගන්න ග්‍රැමෆෝන් ගීයට හැකි වුණා.

අපේ රටේ ගුවන්විදුලි සංගීතය ආරම්භ වීමට ප්‍රථම ජනප්‍රියම සංගීතය බවට පත් වුණේ ග්‍රැමෆෝන් සංගීතයයි.

ඉන්දියාවේ පිහිටා තිබුණු ඩම් ඩම් යන කර්මාන්ත ශාලාවෙන් තාවකාලිකව ශබ්දාගාරයක් නිර්මාණය කරන්න අවශ්‍ය තාක්ෂණය අපේ රටට ලැබුණා. තාවකාලිකව ශබ්දාගාරය නිර්මාණය කරන අතරතුරේ දී මාස 3ක කාලයක් ගීත සඳහා පුහුණුවීමට නිර්මාණකරුවන්ට සිදු වුණා. මාස 3ක පුහුණුවීම් කාලයකට ගිවිසුම අනුව බොහෝ විට එකඟවීමට ඔවුන්ට සිදු වෙනවා. තාවකාලිකව කුලියට ගන්නා සංගීත කාමරයක එච්.ඩබ් රූපසිංහ ප්‍රමුඛ එච්.එම්.වී ලේබලයේ අයත් මොහොමඩ් ගවුස් ප්‍රමුඛ කොළොම්බියා ලේබලයේ අයත් පුහුණුවීම් කරගෙන යද්දී ගීත රචකයන් මේ කාමරයට ඇවිල්ලා තනුව අනුව හෝ තනුව නැතිව ගීත ලිවිය යුතුයි. වාදනයත්, ගායනයත් මාස 3ක් තිස්සේ පුහුණුවීමෙන් පසුවයි සාදා ගත් ශබ්දාගාරයට ගොස් ගීත පටිගත කරන්නෙ. ගායන ශිල්පියාටත්, විස්සක් පමණ වූ වාදක කණ්ඩායමටත් තිබුණේ එකම එක මයික්‍රෝෆෝනයයි. විශාල වශයෙන් මුදල් වැයවීම අවම කරන්නයි මේ අයුරින් පුහුණුවීම් කටයුතු කිරීමට එම සමාගම් යොමු වුණේ. සමහර වෙලාවට පටිගත කළ තැටි ඉවත් කිරීමට සිදුවුණු අවස්ථාවල දි සමාගම්වලට පාඩුත් සිදු වී තිබෙනවා.

අමරදේවයන් ගායකයෙක් බවට පත් වුණෙත් තැටි ඉවත දැමීමේ සිද්ධියක් නිසයි. රසයි කිරි නෑ දියාරු ගීතය අමරදේවයන් ග්‍රැමෆෝනය සඳහා ගායනා කළේ සිරිමති වෙත්තසිංහ ගායිකාවත් සමඟයි. ඇය සමඟ රසයි කිරි නෑ දියාරු යන ගීතය ගායනා කරන්න හිටපු ගායකයා තුන් හතර පාරක් උත්සාහ ගත්තත් ඔහුට සාර්ථකව ගායනය කරන්න බැරි වුණා. ඒ නිසා ගවුස් මාස්ටර්ගේ වාදක මණ්ඩලයේ වයලිනය වාදනය කරමින් සිටි එබ්.ඩී ඇල්බට් පෙරේරා(අමරදේව)ට මේ ගීතය ගායනය කරන්න සිදු වුණා. අමරදේවයන් ගායකයෙක් වුණේ මේ ගීතය සමඟයි.

මහාචාර්ය සුනිල් ආරියරත්න

**Latest Test Ranking**

| Rank | Batsman | Points |
|---|---|---|
| 1 | Lara | 886 |
| 2 | Kallis | 882 |
| 3 | Dravid | 872 |
| 4 | Ponting | 863 |
| 5 | Sehwag | 848 |
| 6 | Martyn | 836 |
| 7 | Gilchrist | 819 |
| 8 | Inzamam | 794 |
| 9 | Younis | 857 |
| 10 | Strauss | 751 |

| Rank | Bowler | Points |
|---|---|---|
| 1 | McGrath | 897 |
| 2 | Muralitharan | 834 |
| 3 | Pollock | 812 |
| 4 | Ntini | 801 |
| 5 | Akhtar | 786 |
| 6 | Warne | 771 |
| 7 | Kumble | 766 |
| 8 | Nel | 759 |
| 9 | Gillespie | 739 |
| 10 | Harmison | 717 |